# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2016

### 2022 නොවැම්බර් - 2023 ජනවාරි

### සමාජීය විද්‍යා පීඨය

### ජනසන්නිවේදනය (නව/පැරණි නිර්දේශය)

### මාධ්‍ය ආචාර ධර්ම, මහජන සම්බන්ධතාව හා දැන්වීම් කලාව MACO – E 3015

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. මහජන සම්බන්ධතාව යනු කුමක්දැයි නිර්වචන ආශ්‍රිතව පැහැදිලි කොට, පුද්ගලයෙකුට, සංවිධානයකට හෝ ආයතනයකට මහජන සම්බන්ධතාව වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 20)

02. මහජන සම්බන්ධතාවේ ඓතිහාසික සංධිස්ථාන පිළිබඳ විවරණයක යෙදෙන්න.

(ලකුණු 20)

03. මුද්‍රිත මාධ්‍ය දැන්වීම්කරණ ක්‍රමවේද හඳුන්වා, ඒවායේ ශක්‍යතාවන් පිළිබඳ විමසීමක් කරන්න.

(ලකුණු 20)

**හෝ**

"වෙළඳ ප්‍රචාරණයේදී අනෙකුත් මාධ්‍යයන්ට වඩා සමාජ මාධ්‍ය වඩාත් ප්‍රබල ය." සමාජ මාධ්‍ය ප්‍රචාරණ විධික්‍රම හඳුන්වා, එහි ඇති ඵලදායිත්වය පිළිබඳ විශ්ලේෂණයක යෙදෙන්න.

(ලකුණු 20)

04. දැන්වීම් ප්‍රචාරණ ආයතනයක ව්‍යුහය සහ කාර්යභාරය පැහැදිලි කරන්න.

(ලකුණු 20)

05. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ජනමාධ්‍ය ආයතන සම්බන්ධ පණත් දෙකක් පිළිබඳ විවරණයක් සපයන්න.

(ලකුණු 20)

06. "පුවත්පත් ආචාර ධර්ම හා මාර්ගෝපදේශ පැවතිය ද එම ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුව අවම මට්ටමක පවතී." ඔබගේ නිරීක්ෂණ දක්වන්න.

(ලකුණු 20)

07. "ජනමාධ්‍ය වාරණය විවිධ මුහුණුවරින් ක්‍රියාත්මක වේ." පසුගිය දශක හතර තුළ ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හා බැඳුණු වාරණ සිද්ධීන් හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

**08. මාතෘකා හතරක් (04) සඳහා පමණක් කෙටි සටහන් ලියන්න.**

(අ) මහජන සම්බන්ධතා ප්‍රභේද

(ආ) ආයතනික මහජන සම්බන්ධතාව

(ඇ) මහජන සම්බන්ධතා සැලසුම්කරණය

(ඈ) දැන්වීම්කරණ පර්යේෂණ

(ඉ) දැන්වීම් නිර්මාණකරණ එළඹුම්

(ඊ) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය

(එක් කොටසකට ලකුණු 05 බැගින් 05 x 04 = 20)

************************************